10922

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 8 - ශ්‍රේණිය

## චිත්‍ර කලාව I

නම/විභාග අංකය:- ..................................................................................... කාලය: විනාඩි 30යි.

- සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා දී ඇති රූප සටහන්වලට ගැළපෙන රූපයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉර මත ලියන්න.

01.  ____________

02.  ____________

03.  ____________

04.  ____________

05.  ____________

 A

 B

 C

 D

 E

• **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා පිළිතුරු, අදාළ හිස්තැන් හි ලියන්න.**

06. චිත්‍ර සංරචනයේ දී දුර වස්තූන් කුඩාවටත්, ළඟ වස්තූන් විශාලවත් දක්වීම ........................................ නමින් හැඳින්වේ.

07. පිත්තල කර්මාන්තයේ දී වාත්තු වැඩ හා ........................................ යනුවෙන් ශිල්ප ක්‍රම දෙකකි.

08. සඳකඩ පහණෙහි ........................................ කැටයමෙන් 'නිවන' සංකේතවත් වන බව සෙනරත් පරණවිතාන මහතාගේ අදහසයි.

09. ස්තූපයේ ආරක්ෂාවට හා අලංකාරය පිණිස ඉදි කරනු ලැබූ ගොඩනැගිල්ල ........................................ යනුවෙන් හඳුන්වයි.

10. යම් වස්තුවක ත්‍රිමාණ ලක්ෂණ ලෙස හඳුන්වනු ලබන්නේ එහි දිග, පළල ........................................ දක්වීමයි.

• **පහත අංක 11 සිට 15 දක්වා නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

11. ථූපාරාම ස්තූපය ඉදි කරන ලද්දේ,
(i) දුටුගැමුණු රජතුමා විසිනි. (ii) යටාලතිස්ස රජතුමා විසිනි.
(iii) මහසෙන් රජතුමා විසිනි. (iv) දේවානම් පියතිස්ස රජතුමා විසිනි.

12. 'අල්ටමයිරා' ගුහා චිත්‍ර අයත් වන්නේ,
(i) පුනර්ජීවන යුගයටය. (ii) යුරෝපා ප්‍රාග් ඓතිහාසික යුගයටය.
(iii) සම්භාව්‍ය යුගයටය. (iv) හෙලනිස්ටික් යුගයටය.

13. කැරොල් ගී ගායනය ආගමික අංගයක් ලෙස භාවිතයට ගනු ලබන්නේ,
(i) බෞද්ධ ආගමිකයන් ය. (ii) ඉස්ලාම් ආගමිකයන් ය.
(iii) කිතුනු ආගමිකයන් ය. (iv) හින්දු ආගමිකයන් ය.

14. සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් ගණන,
(i) තුනකි. (ii) පහකි.
(iii) හතකි. (iv) හතරකි.

15. වර්ණ චක්‍රයේ ඇතුළත් ද්විතියික වර්ණ ගණන වනුයේ,
(i) දෙකකි. (ii) හතරකි.
(iii) තුනකි. (iv) පහකි.

• **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රකාශ හරි නම් '✓' ලකුණ ද වැරදි නම් '✕' ලකුණ ද යොදන්න.**

16. රුවන්වැලි දාගැබ සතර දිසාවේ දාගැබට සම්බන්ධ වාහල්කඩ හතරකි. (.........)

17. ශ්‍රී ලංකාවේ දේශිය ශාන්තිකර්ම සඳහා ගොක් සැරසිලි විවිධ අයුරින් භාවිත කරනු ලබයි. (.........)

18. මූර්තියක් ඇඹීම සඳහා යොදාගත හැකි පහසුම මාධ්‍යය කළුගල් වේ. (.........)

19. සප්තනාරි පල්ලැක්කිය නිර්මාණය කිරීමේ දී ස්ත්‍රී රූප 7ක් යොදා ඇත. (.........)

20. මහනුවර යුගයට අයත් බිතු සිතුවම්වල පසුබිම සඳහා අඳුරු රතු වර්ණය යොදා නොගනියි. (.........)

(එක් ප්‍රශ්නයකට 2 × 20 = 40කි.)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 8 - ශ්‍රේණිය

## චිත්‍ර කලාව II

නම/විභාග අංකය:- .................................................................................... කාලය: පැය 1 1/2යි.

❖ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.

### චිත්‍ර සම්පිණ්ඩනය

1. බෝධි පූජාවක යෙදෙන සැදැහැවතුන් පිරිසක්.
2. පාසලේ පිරිසිදු කිරීම් කටයුතුවල යෙදෙන සිසුන් පිරිසක්.
3. ගොවිතැන්වල යෙදෙන ගොවි ගෙවිලියන් පිරිසක්.
4. බස් නැවතුම්පළක දී මුහුණ දුන් අත්දැකීමක්.
5. ගස්වැල් සතුන් සහිත වනයක අසිරිය.

### මෝස්තර නිර්මාණය හා ග්‍රැෆික් චිත්‍ර

6. සාම්ප්‍රදායික සැරසිලි ඇසුරු කරගෙන බතික් සරමකට මෝස්තරයක්.
7. මල් කොළ සහිත ව්‍යාප්ත මෝස්තරයක්.
8. කුඩා දරුවන්ගේ තෑගි, ඔතන කොළයකට සුදුසු මෝස්තරයක්.
9. ළමා කතන්දර පොතකට පිටකවරයක් (සුදුසු නමක් ද යොදන්න )
10. චොකලට් වර්ගයක් ප්‍රචාරය සඳහා වෙළෙඳ දැන්වීමක් (සිංහල හෝ ඉංග්‍රීසි අක්ෂර භාවිත කරන්න.)

(ලකුණු 60 යි.)